නීතිවිරෝධී ලෙසින් ඉන්දියාවට රත්‍රන් රැගෙන ගිය ශ්‍රී ලාංකික පිරිසක් බැංගලෝරයේදී අත්අඩංගුවට පත්වූයේ යැයි කියවෙන සිදුවීමක්, නොවැම්බර් 24 මාධ්‍ය තුළ ආවරණය වී තිබිණි.

එහිදී අරුණ සහ මව්බිම පුවත් සිරස්තල තුළ මෙම පුවත වාර්තා වී තිබුණේ "ශ්‍රී ලාංකිකයෝ 10 ක්", "ශ්‍රී ලාංකිකයින් දස දෙනෙකු" ලෙසින් සඳහන් කරමිනි. එසේම පුවත් අන්තර්ගතයන් තුළ කාන්තාවන් අට දෙනෙකු සහ පිරිමි පුද්ගලයන් දෙදෙනෙකු එසේ අත්අඩංගුවට ගැනුණු බව සඳහන් වී තිබිණි. The Morning පුවත්පතද මෙය වාර්තා කරන්නේ, 'two men and eight women' යනුවෙන් සඳහන් කරමිනි.

මේ අතර ලංකාදීප මෙම පුවත වාර්තා කරන්නේ "ගැණු 8 ක් රත්‍රන් කිලෝ 3 ක් ඇඟේ හංගගෙන ඉන්දියා ගිහින්" යනුවෙනි. දිනමිණ වාර්තා කළ මෙම පුවත තුළ "කාන්තාවන් 8 ක් ඇතුළු ලාංකිකයෝ 10 ක්" යනුවෙන් සඳහන් වී තිබේ.

මේ අනුව,

1) මෙහි එකම වරදක් සිදුකළ පිරිසෙන් කාන්තාවන් පමණක් ඉස්මතු වී ඇත්තේ, එම වරද සම්බන්ධයෙන් කාන්තාවන්ට වැඩි වගකීමක් අදාළ වන බවක් පෙන්වීමට ද?

2) එය කාන්තාව සෘණාත්මක ලෙසින් ඉස්මතු කිරීමක් සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමක් යැයි ඔබ නොසිතන්නේ ද?

3) ඒ අනුව, පහත පුවත් වාර්තාකරණයන්ගෙන්, වඩාත් ආචාර ධාර්මික යැයි ඔබ තෝරාගන්නේ කුමන පුවත් වාර්තාවන් ද?